THE EDUCATION STATE

SCHOOLS

# දෙමාපියන් හා රැකවරණ සපයන්නන් වෙත වන පණිවුඩය

හිතවත් දෙමාපියන් හා රැකවරණ සපයන්නන් වෙත,

පසුගිය සති කිහිපය මුලුල්ලේ දුරස්ථ හා නම්‍යශීලී ඉගෙනීම සම්බන්ධයෙන් ඔබ ලබා දුන් සහයෝගයට ස්තුතිවන්ත වෙමු.

වික්ටෝරියාවේ ප්‍රධාන සෞඛ්‍ය නිලධාරීගේ උපදේශය පරිදි, අදියර වශයෙන් සිදුවන ක්‍රියාවලියකින් ආපසු පාසැල තුළ පාසැල් කටයුතු ආරම්භ කළ හැකි බවට වික්ටෝරියානු රජය විසින් දන්වා තිබේ.

**පළමු අදියරේ** දී ප්‍රෙප්, 1 වසර හා 2 වසර, ජ්‍යෙෂ්ඨ ද්විතීයික (11 හා 12 වසර සිසුන් VCAL සහ VCE) සිසුන් හා විශේෂිත පාසැල්වල සියලු සිසුන් මැයි 26 වැනි අඟහරුවාදා සිට පාසැලට ආපසු පැමිණීමට නියමිතය.

10 වැනි වසරේ සිටින VCE VET විෂයන් ඇතුළු VCE හදාරන සිසුන් ද ප්‍රායෝගිකව සිදු කළ හැකි අවස්ථාවල දී එම පන්තිවලට සහභාගී වීමට පාසැලට පැමිණිය යුතුය. ඔබේ දරුවාට/දරුවන්ට මෙය කළ නොහැකි නම්, පාසැල් පැමිණෙන දරුවන්ට ලබා දෙන වැඩ කටයුතු ම ඔබේ දරුවාට ද ලබා දීමට අපගේ ගුරු මණ්ඩලය කටයුතු කරනු ඇත.

මෙම සංක්‍රාන්තිය සඳහා සූදානම් වීමට කාර්ය මණ්ඩලයට අවස්ථාවක් ලබා දීම සඳහා මැයි 25 වැනි සඳුදා සිසුන් රහිත පාසැල් දිනයක් ලෙස සැලකේ.

පාසැලට ආපසු පැමිණීමේ **දෙවැනි අදියරේ** දී ජුනි 9 වැනි අඟහරුවාදා සිට අනෙක් වසර මට්ටම්වල සිසුන් ආපසු පාසැලට පැමිණීම සිදු වනු ඇත.

මැයි 26 වැනි අඟහරුවාදා සිට ජුනි 9 වැනි අඟහරුවාදා තෙක් සති දෙක තුළ, නිවසේ දී අධීක්ෂණය සිදු කිරීමට අපහසු අවදානමට සහිත සිසුන් සඳහා දැනට පවත්නා පාසැල තුළ පාසැල් කටයුතු කිරීමේ ආකෘතිය පවත්වා ගැනීමට කටයුතු කෙරේ. මේ සති දෙක ඇතුළත, පාසැලේ දී ඉගෙනීම් සිදුවන දින හා අර්ධ දින ගැන දෙමාපියන් හා රැකවරණ සපයන්නන් දැනුවත් කිරීමට දැනට පවත්නා ක්‍රියාමාර්ග ම යොදා ගැනෙනු ඇත.

මෙම වසර මට්ටම්වල සෙසු සියලු සිසුන් ජුනි 9 වැනි අඟහරුවාදා දක්වා නිවසේ සිට ඉගෙනීම් කටයුතු සිදු කිරීමට නියමිතය.

කිසියම් වසර මට්ටමක් ආපසු පාසැලට පැමිණීමෙන් අනතුරුව, අදාළ වසර මට්ටමේ සියලු සිසුන් සාමාන්‍ය පරිදි පාසැලට පැමිණිය යුතු බව අපේක්ෂා කෙරේ. එනම්, ඔබේ දරුවා/දරුවන්ගේ වසර මට්ටම ආපසු පාසැලට පැමිණීමෙන් පසුවත් ඔවුන් නිවසේ තබා ගැනීමට ඔබ තීරණය කළහොත් නිවසේ සිට සිදුකෙරෙන ඉගෙනීම් කටයුතුවලට තව දුරටත් සහයෝගය ලබා දීමට අපට හැකියාවක් නැත.

වෛද්‍ය හේතු නිසා පාසැලට පැමිණිය නොහැකි දරුවන්ට මෙය අදාළ නොවේ. එවන් අය සුදුසු සැලැස්මක් සකස් කර ගැනීමට කරුණාකර අප අමතන්න.

වික්ටෝරියාවේ සියලු රජයේ පාසැල් මෙම ප්‍රවේශය අනුගමනය කරනු ඇත.

සියලු සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අවශ්‍ය සහයෝගය සැපයීමට, පාසැල් විසින් වැඩි දියුණු කෙරුණු පිරිසිදු කිරීමේ ක්‍රියාපටිපාටි පවත්වා ගෙන යන අතර නිතර දෑත් සේදීමට දිරි ගැන්වේ.

ඔබේ දරුවා කිසියම් අසනීප තත්ත්වයකින් සිටියි නම්, ඔවුන් පාසැලට නොපැමිණිය යුතුය. ඔවුන් නිවසේ සිට වෛද්‍ය උපදෙස් පැතිය යුතුය.

පාසැලේ දී සිසුන් ශාරීරික දුරස්ථතාව පවත්වා ගැනීමට අවශ්‍ය නොවන බව ප්‍රධාන සෞඛ්‍ය නිලධාරී විසින් ප්‍රකාශ කර ඇති නමුත් සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව සකස් වූ සියලු පාසැල් සඳහා වන පාසැල් මෙහෙයුම්වල දී සැළකිය යුතු වැදගත් වෙනස්කම් ගණනාවක් පිළිබඳ තොරතුරු මෙතනින්

https://www.education.vic.gov.au/about/department/Pages/coronavirus.aspx



VICTORIA State Government | Education and Training

ලබා ගත හැකිය. වැඩිදුර තොරතුරු නිකුත් වන තෙක් මෙය අදාළ වනු ඇත. හැකි ඉක්මණින් අපගේ පාසැල් සන්දර්භය සඳහා වැඩිදුර තොරතුරු සැපයීමට බලාපොරොත්තු වන අතර එතෙක්, පහත කරුණු ඇතුළත් ව දැනට සිදුවී ඇති වෙනස්කම් ගැන සැළකිලිමත්වීම වැදගත්ය :

- පාසැල දැමීම හා ආපසු ගැනීම සම්බන්ධයෙන් වෙනස්කම් සිදු වනු ඇති අතර. එක් එක් වසරවලට එකිනෙකින් වෙනස් ආරම්භ වීමේ හා අවසාන වීමේ වේලාවන් මෙයට ඇතුළත්ය;
- සෘජු පාසැල් කාර්ය මණ්ඩලයට හා සිසුන්ට හැර වෙනත් අයට පාසැල්වලට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් සීමාපැනවීම;
- අප ගුරු දෙගුරු රැස්වීම් හා සාකච්ඡා පවත්වන ආකාරය.

ආපසු පංති කාමරයට පැමිණ ඉගැන්වීම හා ඉගෙනීම කිරීම සම්බන්ධයෙන් ඔබ අතරින් සමහර දෙනාට සිත් තැවුල් ඇති බව අපි දැන සිටිමු. අපගේ ප්‍රාන්තයේ පවත්නා හොඳම සෞඛ්‍ය උපදෙස් අනුව මෙම තීරණය ගෙන ඇති බව මම වගකීමෙන් යුතුව පවසමි.

පාසැල් වෙත ආපසු යාම හා කොරෝනා වෛරසය (COVID-19) සඳහා අඛණ්ඩ යාවත්කාලීන විස්තර අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත හැකිය:

https://www.education.vic.gov.au/about/department/Pages/coronavirus.aspx

මේ දුෂ්කර කාල සීමාවේ ඔබේ අඛණ්ඩ සහයෝගය හා ඉවසීම වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙමු.

සිසුන් නැවත පංති කාමරය වෙත පිළිගැනීමට අපි මහත් අපේක්ෂාවෙන් සිටිමු.